# බප/ ජය/ ආනන්ද ශාස්ත්‍රාලය

## දෙවන වාර ඇගයීම - 2014

# නාට්‍ය හා රංග කලාව

**8 වන ශ්‍රේණිය** **කාලය පැ. 2**

**නම:** ............................................................ **පංතිය:**...............

105

01. නාට්‍යයක් රස විඳීමේදී ප්‍රධාන වන්නේ,

i. නාට්‍ය පිටපත
ii. ඇඳුම් පැළඳුම්
iii. වේදිකාව
iv. කථා වස්තුවය

02. පහත සඳහන් නාට්‍ය අතර ළමා නාට්‍යයන් වන්නේ,

i. විකාති, නරි බෑණා
ii. සෙල්ලං ලෙල්ලං, වලහා හා මාෂා
iii. වලහා හා මාෂා, මනමේ
iv. මනමේ හා සෙල්ලං ලෙල්ලං

03. මාෂා සහ වලහා නාට්‍ය මගින් සන්නිවේදනය කරනු ලබන්නේ,

i. අවිහිංසාවාදී විය යුතු බවයි
ii. නපුරු චේතනා ජයගත යුතු බවය
iii. ළමුන් විනෝද විය යුතු බවය
iv. හිතුවක්කාර වීම හොඳ ලක්ෂණයක් බවය

04. වේෂ භූෂණ යනු,

i. අංග රචනයයි
ii. පසුතල නිර්මාණයි
iii. රංග වස්ත්‍රාභරණයි
iv. වේදිකාවයි

05. නාට්‍ය කලාවේ මූලික අරමුණ වනුයේ,

i. උපදේශයන් දීමය
ii. දැනුම ලබා දීමයි
iii. කතාවක් කීමය
iv. ප්‍රේක්ෂකයන්ට සෞන්දර්යාත්මක වින්දනයක් ලබා දීම

06. රඟපෑම සඳහා යොදා ගනු ලබන ස්ථානය සෑම විටම,

i. වේදිකාවක් විය යුතුය
ii. ඒ සඳහා විශේෂයෙන් වෙන් කරන ලද භූමි භාගයක් විය යුතුය
iii. ප්‍රේක්ෂකයාට දැක ගත හැකි ස්ථානයක් විය යුතුය
iv. වහලකින් යුක්ත විය යුතුය.

07. අංග රචනයේදී ප්‍රධාන වන්නේ රූපණ ශිල්පියාගේ,

i. කකුලය
ii. බඩය
iii. හිසකෙස්ය
iv. මුහුණය

08. රූකඩ නාට්‍යවල පසුතල නිර්මාණ,

i. අධික වියදම් සහිත ඒවා විය යුතුය
ii. වඩාත් සරල විය යුතුය
iii. අලංකාර නොවිය යුතුය
iv. බර වැඩි විය යුතුය.

09. සාත්වික අභිනය නිරූපණය වන්නේ,

i. වචන වලිනි
ii. අංගචලන වලිනි
iii. ඇඳුම් පැළඳුම් වලිනි
iv. මුහුණේ හැඟීම් වලිනි

10. නාට්‍යයකට අවශ්‍ය නළු නිළියන් තෝරා ගැනීම හඳුන්වන්නේ,

i. අධ්‍යක්ෂණය ලෙසය
ii. නළු වරණය ලෙසය
iii. නිෂ්පාදනය ලෙසය
iv. අනුරූපනය ලෙසය

11. ආනුෂාංගික කලාවන්ට අයත් නොවන්නේ,

i. නළු නිලියන්ය
ii. සංගීතයයි
iii. රංගාලෝකයයි
iv. නර්තනයයි

12. ආනුෂාංගික කලාවන් අයත් වන්නේ,

i. සාත්වික අභිනයටය
ii. ආහාර්ය අභිනයටය
iii. වාචික අභිනයටය
iv. ආංගික අභිනයටය

13. උඩරට ශාන්තිකර්ම සඳහා වාදනය කරනු ලබන්නේ

i. දවුලයි
ii. පහතරට බෙරයයි
iii. තම්මැට්ටමයි
iv. ගැටබෙරයයි

14. "සවන් දී පෙර රාම චරිතේ අසව්" මෙම ගීතය අයත් වන්නේ,

i. සිංහබාහු නාට්‍යටය
ii. නරිබෑනා නාට්‍යටය
iii. රාමායනය නුර්තියටය
iv. මුදු පුත්තු නාට්‍යටය

15. වාචික අභිනය භාවිතා නොකරන්නේ,

i. නාට්‍ය සඳහායි
ii. ක්ෂණික නිරූපණය සඳහාය
iii. අභිරූපණ සඳහාය
iv. ගීත නාට්‍ය සඳහාය

16. "සාන්කුවර සෙබළානෝ " නිෂ්පාදනය කළේ,

i. සුගතපාල ද සිල්වාය
ii. එදිරිවීර සරත්චන්ද්‍රයන්ය
iii. හෙන්රි ජයසේනය
iv. ජයලත් මනෝරත්නය

17. නළුවකුගේ / නිළියකගේ ප්‍රධාන කාර්ය භාරය වනුයේ,

i. දෙබස් පැහැදිලිව උච්චාරණය කිරීමයි
ii. පසුතලය වර්ණනා කිරීමයි
iii. චරිතයක් නිරූපනය කිරීමයි
iv. ලාලිත්‍යයෙන් යුතුව රඟපෑමයි

18. නාට්‍යෝපකරණය යනු,

i. වේදිකා සැරසිලිය
ii. නළුවන්ගේ වේෂ නිරූපණය
iii. රංගය මත නළුවන් භාවිතා කරන විවිධ භාණ්ඩය
iv. විවිධ ආලෝක පහන් කට්ටලය

19. පහත දැක්වෙන ළමා නාට්‍ය අතුරෙන් සෝමලතා සුබසිංහගේ නිර්මාණයක් නොවන්නේ,

i. සෙල්ලං ලෙල්ලංය
ii. තොප්පි වෙළෙන්දා
iii. හිම කුමරියය
iv. පුංචි අපිට දැන් තේරෙයි

20. රූකඩ නාට්‍යයක ප්‍රධාන ශිල්පියා,

i. පොතේ ගුරුය
ii. කාරියකරවන රාළය
iii. ගායක වෘන්දයය
iv. සූත්‍රධාරය

- ප්‍රශ්න අංක **21** සිට **30** දක්වා ප්‍රශ්නවල හිස් තැනට සුදුසු පිළිතුරු වරහන් තුලින් තෝරා ලියන්න.

21. ප්‍රතිවිරුද්ධ අදහස් මතුවීමෙන් ................................ අවස්ථා නිර්මාණය වේ.
22. සෙල්ලං ලෙල්ලං ...................................... නාට්‍යයකි.
23. ළමුන් තුල පවතින ............................. නාට්‍ය පුරා දිස්වේ.
24. සෑම ළමයකු සතුවම නිවසේදී ඉටු කළ යුතු ............................ බොහොමයක් ඇත.
25. අත්දැකීම් ......................... කළ හැක.
26. ඕනෑම සාහිත්‍ය නිර්මාණයක් බිහි වන්නේ කිසියම් ...................................... පදනම් කරගෙනය.
27. ...................................... යනු අලුතින් යමක් සිතීම හා මවා ගැනීමය.
28. ...................................... මගින් මුහුණු අංග රචනය කරනු ලැබේ.
29. රූකඩ නාට්‍ය වල ............................ විශේෂ ස්ථානය හිමි වේ.
30. ............................. යනු සිරුරේ සියලු අඟ පසඟ හා සම්පූර්ණ ශරීරය සැහැල්ලු බවට පත් කිරීමය

(තේමාවන් / යුතුකම් / ගැටුම් / ප්‍රතිනිර්මාණය / ළමා / ක්‍රීඩා ලෝලීත්වය / ශිථිලකරණය / සංගීතයට / වර්ණ හා රේඛා / පරිකල්පනය)

- නිවැරදි පිළිතුර යා කරන්න

| | |
|---|---|
| 31. ප්‍රවීන නාට්‍ය ශිල්පියෙකි | වාචික |
| 32. ජන නාට්‍යයකි | ඔලිඳ කෙළිය |
| 33. සෙල්ලුං ලෙල්ලං | අම්තා රබ්බිඩිගල |
| 34. අභිනයකි | ජයලත් මනෝරත්න |
| 35. ජන ක්‍රීඩාවකි | සොකරි |

- **36 සිට 40 දක්වා ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ලියන්න.**

36. වලහා හා මාෂා නාට්‍ය කාගේද?
37. අභිරූපණය යනු කුමක්ද?
38. නාට්‍ය සංගීතය අයත් වන්නේ කුමන අභිනයට ද?
39. රූකඩ වර්ග 2 නම් කරන්න
40. රූකඩ සංගීතය සඳහා යොදා ගන්නා භාණ්ඩ 2 නම් කරන්න

## II කොටස

- **ප්‍රශ්න 4 ට පිළිතුරු ලියන්න.**

**1.**

**I.** "මාෂා සහ වළහා" නාට්‍ය කාගේ නිර්මානයක්ද?

(ල.3)

**II.** එම නාට්‍ය මගින් සන්නිවේදනය කරනු ලබන කරුණු කිහිපයක් නම් කරන්න.

(ල.6)

**III.** සෙල්ලං ලෙල්ලං නාට්‍යයෙන් සන්නිවේදනය කරනු ලබන කරුණු කිහිපයක් නම් කරන්න.

(ල.6)

**2.**

**I.** රූකඩ නාට්‍ය වර්ග කරන්න.

(ල.4)

**II.** රූකඩ වස්ත්‍ර වර්ගග කිරිමේදී සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයක් නම් ලියන්න.

(ල.5)

**III.** සෙවනැලි රූකඩ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(ල.6)

**3.**

**I.** රංග අභ්‍යාසය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.

(ල.3)

**II.** රංග අභ්‍යාස වර්ග 3 නම් කරන්න.

(ල.6)

III. පොදුවේ රංග අභ්‍යාසවලින් අත්වන ප්‍රයෝජන කිහිපයක් නම් කරන්න. (ල.6)

4.

I. අභිනය කොටස් කීයද? (ල.4)

II. ඒවා නම් කරන්න (ල.5)

III. ඉන් එක් අභිනයක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල.6)

5.

I. ළමා නාට්‍ය ප්‍රධාන වශයෙන් කොටස් කීයකට බෙදේද? (ල.3)

II. ළමා නාට්‍ය නිෂ්පාදකවරයකු සැලකිය යුතු කරුණු මොනවාද? (ල.6)

III. ඔබ දන්නා ළමා නාට්‍ය කිහිපයක් නම් කරන්න. (ල.6)